**පැලියගොඩ මධ්‍යම මත්ස්‍යා වෙළෙඳ සංකීර්ණ කළමනාකරණ භාරය - 2015**

-----------------------------------------------------------------------------------------

පැලියගොඩ මධ්‍යම මත්ස්‍යා වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 ජූනි 03 දිනැති අංක අමප/10/0958/438/001 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කළමනාකරණ භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කළමනාකරණ භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 කළමනාකරණ භාරය පිහිටුවීම**

--------------------------------

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් 2010 මැයි 14 දින ඉදිරිපත් කරන ලද පැලියගොඩ මධ්‍යම මත්ස්‍යා වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය පිහිටුවීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2010 ජූනි 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එකී තීරණය ප්‍රකාරව කළමනාකරණ භාරය පිහිටුවා තිබුණ ද, 2016 නොවැම්බර් 30 දක්වාම ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිගත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

1.5 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ කළමනාකරණ භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) වත්කම් හා බැරකම් ශේෂ හිලව් කළ නොහැකි වුවද, එකතුව රු. 101,359 ක් වූ වත්කම් ශේෂ 4 ක් ණයහිමියෝ හා අනෙකුත් බැරකම් වලට හිලව් කර තිබුණි.

(ii) වත්කම්වල ධාරණ අගය නිශ්චය කිරීමේදී අනාගත අවිනිශ්චිත සිදුවීම්වල බලපෑම ඇස්තමේන්තු කළ යුතු වුවද, රු. 54,238,648 ක් වූ ලැබිය යුතු කඩ කුලී ආදායම මත ඇතිවිය හැකි අවදානම වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 153,790 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 2 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එම වත්කම් මත පිරිවැය ඉක්මවා රු. 10,756 ක් ක්ෂය කර තිබුණි.

(ii) වත්කම් භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, ඊට පටහැනිව වර්ෂය ආරම්භයේ පැවති වත්කම් පදනම් කරගෙන ක්ෂය ගණනය කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂය තුළ අත්පත් කරගත් රු. 58,053 ක් වූ වත්කම් පරිභෝජනයට ගෙන තිබුණද, ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදන කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිරිවැය රු. 38,598,438 ක් වූ අපද්‍රව්‍ය පිරිපහදු යන්ත්‍රාගාරයේ ඇතුළත් ගොඩනැගිලි පිරිවැය හා යන්ත්‍ර පිරිවැය වෙන් වෙන්ව හඳුනාගෙන සුදුසු අනුපාත මත ක්ෂය කරනු වෙනුවට සමස්ත පිරිවැය සඳහා සියයට 5 බැගින් ක්ෂය කර තිබුණු අතර, අයිස් නිෂ්පාදනාගාරය ගොඩනැගිල්ලක් වශයෙන් සලකා වාර්ෂිකව සියයට 3 බැගින් ක්ෂය කර තිබුණි. එසේම මෙහෙයුම් කටයුතු ආරම්භ කර වසර 4 ක් ඉක්ම යාමට පෙර අයිස් යන්ත්‍රාගාරයේ සම්පීඩන යන්ත්‍රය නැවත යොදා අලුත්වැඩියා කිරීම සඳහා 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු. 2,656,080 ක් වැය කිරීමට සිදුවීම හේතුවෙන් එහි ජීවකාලය මත ක්ෂය අනුපාතය තීරණය කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය ප්‍රතිපාදන රු.1,293,531 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සාධාරණ වටිනාකම රු. 57,255 ක් වූ ටී ෂර්ට් තොගය මූල්‍ය ප්‍රකාශනවල රු. 127,988 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.70,733 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) ලංකා ධීවර සංස්ථාවට කුලියට දී තිබුණු කඩකාමර 02 ක් 2015 ජූනි මස ආපසු පවරා ගෙන තිබුණු අතර එදින සිට 2015 දෙසැම්බර් 31 දක්වා කඩකුලී ආදායම, ලැබිය යුතු කඩකුලී ලෙස ජර්නල් සටහනක් මගින් ගිණුම් ගත කිරීම නිසා කඩකුලී ආදායම හා ලැබිය යුතු කඩකුලී ආදායම රු.924,000 කින් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ අයිස් නිෂ්පාදනාගාරයේ සම්පීඩන යන්ත්‍රයක් සවිකර අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වැය කළ රු.1,461,440 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දී තිබූ වෙළඳ සංකීර්ණය වෙනුවෙන් වැය කර තිබූ රු. 2,314,760 ක් වූ පුනරාවර්තන ස්වභාවයේ වියදම් ප්‍රාග්ධනිත කිරීමේ වරද සමාලෝචිත වර්ෂයේ දී ද නිවැරදි නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ වත්කම්වල වටිනාකම හා රු. 69,443 ක ක්ෂය වෙන්කිරීම සාවද්‍ය ලෙස දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණු අතර, 2011 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ රු. 129,870 ක් වූ විගණන ගාස්තු, වෙන් කිරීමේ ගිණුමට හර කරනු වෙනුවට වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය සඳහා මොබිටෙල් කුළුණ වෙනුවෙන් රු. 750,000 ක් වූ ලැබිය යුතු බදු කුලී ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ලංකා ධීවර සංස්ථාවට ලැබුණු රථ වාහන ගාල් කිරීමේ ආදායමෙන් භාරයට අයවිය යුතු රු.16,480,355 ක් ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය සඳහා පරිශ්‍ර භූමියේ අයිස් අලෙවි කිරීම වෙනුවෙන් බාහිර පාර්ශවයකින් අයවිය යුතු රු. 500,000 ක ආදායම ලැබිය යුතු අදායම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) භාරයට එරෙහිව පෞද්ගලික සමාගමක් විසින් පවරා තිබූ නඩුවකදී වාරික 6 කින් රු.2,451,250 ක් ගෙවීමට භාරය විසින් එකඟ වී තිබුණි. 2015 නොවැම්බර් 04 දින වනවිට සියලුම වාරික ගෙවා අවසන් කර තිබිය දී තවත් රු. 388,989 ක මුදලක් අදාළ සමාගමට ගෙවිය යුතු ලෙස භාරය විසින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ) තොග වාර්තා අනුව ශේෂය රු.556,705 ක් වූ ටී ෂර්ට් තොගයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.603,115 ක් ලෙස ණයගැතියෝ හා අනෙකුත් ලැබීම් යටතේ දැක්වීමෙන් වත්කම් රු. 46,410 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල මත ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් ආයතනයේ සංඥා කුළුණක් ඉදිකිරීම සඳහා ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව 2015 ජනවාරි මාසයේ සිට රු. 75,000 ක මාසික කුලියකට බදු දී තිබුණි. ඒ සඳහා මාර්තු මාසයේ සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු රු. 750,000 ක් වූ කුලී ආදායම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාරයේ මූල්‍ය ප්‍රකාශන අනුව ලංකා ධීවර සංස්ථාවට ගෙවිය යුතු ශේෂය රු. 2,424,665 ක් ලෙස දක්වා තිබුණ ද, ධීවර සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව භාරයෙන් අයවිය යුතු ශේෂය රු. 99,302 ක් ලෙස දක්වා තිබීම නිසා රු. 2,325,363 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) භාරයේ මූල්‍ය ප්‍රකාශන අනුව ලංකා ධීවර සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂය වශයෙන් රු.16,480,355 ක් දක්වා තිබුණ ද සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව භාරයට ගෙවිය යුතු ශේෂය රු.5,361,333 ක් ලෙස දක්වා තිබීම නිසා රු. 11,119,022 ක වෙනස හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතු වටිනාකම රු. 116,752,402 ක් වූ ස්ථාවර තැන්පතු තුනකට අදාළ තැන්පතු සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) භාරය සතු රථ ගාලේ රථ වාහන මෙහෙයුම් කටයුතු පෞද්ලික සමාගමකට බදු දී තිබුණු අතර එහි ශුද්ධ ආදායමෙන් සියයට 40 ක් භාරයට අය විය යුතු බව ගිවිසුමේ දක්වා තිබුණි. එහෙත් 2015 මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.4,996,052 ක රථ වාහන ගාල් කිරීමේ ආදායම තහවුරු කර ගැනීම සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**--------------------------------**

ණයහිමියෝ හා අනෙකුත් වගකීම් යටතේ ඉකුත් වර්ෂයේ සිට දක්වා තිබුණු එකතුව රු.1,026,505 ක් වූ ශේෂයන් 03 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2013 අංක 17 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 10 වගන්තිය | 2014 වර්ෂයේ රු. මිලියන 88 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 95 ක බදුකුලී ආදායමක් උපයා ඇති භාරය එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි වීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 756, 757 හා 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ආයතනයේ සියළුම අංශ ආවරණය වන පරිදි 2015 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 371 | කළමනාකරණ භාර රැස්වීම්වල සාමාජිකයින්ට දීමනා ගෙවීම සඳහා අවස්ථා 8 කදී ලබාගන්නා ලද එකතුව රු.870,000 ක් වූ අත්තිකාරම් පියවා නොතිබූ අතර සාමාජිකයින් දීමනා ලබාගත් බවට තහවුරු ලේඛන ද ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 3.2 | මිල ගණන් කැඳවීමකින් තොරව පරිශ්‍රය පිරිසිදු කිරීමට පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණි. එම ආයතනය සමඟ වර්ෂ 5 කට එළඹුණු ගිවිසුම අනුව මාසිකව ගෙවිය හැකි ගාස්තුව රු. 1,250,000 කි. එහෙත් ඊට අමතරව මාසිකව රු. 330,000 ක් වශයෙන් 2015 වර්ෂය තුළ රු. 3,960,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඈ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාරයේ 2015 වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනය 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි |
| (ඉ) | 1994 ජුනි 14 දිනැති අංක පීඊඩී/95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාරයේ සභාපති, භාර මණ්ඩලය සඳහා භාණ්ඩාගාරය පත්කළ නියෝජිත, පරිපාලන සම්බන්ධීකාරක, ගණකාධිකාරී හා ගිණුම් සහායක යන අයට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ මාසික දීමනා වශයෙන් රු. 768,124 ක් ගෙවා තිබුණි. |
| (ඊ) | 2015 මැයි 25 දිනැති පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව භාර මණ්ඩලයේ අනුමැතිය මත පමණක් නිලධාරීන් හතර දෙනෙකු වෙත ඉන්ධන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.760,800 ක් ගෙවා තිබුණි. |

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 32,284,953 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 27,815,592 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,469,361 ක පිරිහීමක් දක්නට ලැබුණි. කඩ කුලී ආදායම රු. 6,381,150 කින් වැඩි වී ආරක්ෂක වියදම රු. 1,085,516 කින් අඩුවී තිබුණ ද, වැටුප් හා දීමනා රු. 8,961,902 කින් හා අලුත්වැඩියා හා නඩත්තු වියදම් රු. 2,941,315 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ඌනතාවයක් දක්නට ලැබුණි. කෙසේ වුවද සේවක පාරිතෝෂික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේ දී 2012 වර්ෂයේ රු. 63,908,465 ක ඉහළ දායකත්වයක් පෙන්නුම් කළ ද, පසු වර්ෂවලදී එම මට්ටමෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රමෝපායන් කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

2010 ජුනි 03 දිනැති අංක අමප/10/0958/438/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කළමනාකරණ භාරයේ පරමාර්ථ සහ කාර්ය භාරය පහත දැක්වේ.

(අ) පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පූර්ණ පාලනය සහ කළමනාකරණය භාර ගැනීම සහ එකී සංකීර්ණය කාර්යක්ෂම ලෙස මෙහෙයවීම කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම සහ ඊට සම්බන්ධ හෝ ආනුශාංගික කාරනා ගැන කටයුතු කිරීම.

(ආ) ඉහත ඡේදයේ සඳහන් පරමාර්ථ සහ කාර්ය ඉටුකර ගැනීම සඳහා සීමා කිරීමකින් තොරව සියලුම ක්‍රියාමාර්ග ගැනීම, වෙනත් සියලු පියවර ගැනීම සහ වෙනත් සියලු කටයුතු කිරීමට භාර ගැනීම වේ.

2011 වර්ෂයේ ආරම්භ කරන ලද මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ ප්‍රධානම ආදායම් මාර්ගය, වත්කම් බදු දීම වන අතර, ඒ තුළින් ආදායම් උපරිම අයුරින් රැස්කර ගැනීමට කටයුතු කර නොතිබුණු බව පහත කරුණුවලින් නිරීක්ෂණය විය.

(i) වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ අයිස් යන්ත්‍රාගාරය බදු දීමෙන් ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) වෙළඳ කුටි බදු දීමෙන් ලැබෙන කුලී ආදායම 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 39 කින් පහත වැටී තිබුණි. මීට අදාළ හිඟ හිටි බදුකුලී ආදායම 2014 වර්ෂයේ දී රු.88,377,350 ක් වූ නමුත්, සමාලෝචිත වර්ෂයේ දී එය රු. 54,238,648 ක් වී තිබුණි.

## 4.2. කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද භාරකරුවන් 15 දෙනෙකු විසින් භාරය කළමනාකරණය සම්බන්ධයෙන් වු ප්‍රකාශයකට / ඔප්පුවකට භාරය පිහිටුවීමේ දී අත්සන් තබා තිබුණ ද, ඊට නීත්‍යානුකූල වලංගු භාවයක් ලබා දීම සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගෙන, නීතිඥයෙකු විසින් සහතික කර ලියාපදිංචි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) කළමනාකරණ භාරයේ භාරකරුවෙකු වර්ෂ කීපයක සිටම භාර රැස්වීම් සඳහා සහභාගී වී නොතිබුණ බැවින් වෙනත් භාරකරුවෙකු ඒ වෙනුවට පත්කර ගැනීමට භාරය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) භාරය සතුව තිබෙන පෑළියගොඩ වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ රථ වාහන අංගනයේ, ආදායම් එකතු කිරීමේ කටයුතු ලංකා ධීවර සංස්ථාව විසින් පවරාගෙන 2011 මාර්තු 07 දින දී වසර 10 ක් වැනි දිගු කාලයක් සඳහා පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2013 දෙසැම්බර් 10 දින පැවති කළමනාකරණ භාර රැස්වීමේ දී එම ගිවිසුමේ කාලය 2014 මාර්තු දක්වා පමණක් වලංගු වන පරිදි සංශෝධනය කිරීමටත්, ඉන් පසු නැවත මිල ගණන් කැඳවා ආයතනයක් තෝරා ගැනීමටත් තීරණය කර තිබූ නමුත්, 2016 දෙසැම්බර් වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඈ) මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පිහිටුවා තිබූ පතුරු අයිස් නිෂ්පාදනාගාරයේ මෙහෙයුම් කටයුතු ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව රු. 325,000 ක මාසික බදු මුදලකට, ලංකා ධීවර සංස්ථාවට ලබාදී තිබුණි. එහි ආදායම සංස්ථාව සම්පුර්ණයෙන්ම ලබාගෙන තිබුණු අතර, 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 3,900,000 ක් වු බදු මුදල් භාරයට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාව විසින් භාරයෙන් කුලී පදනම මත ලබාගෙන තිබූ සම්පීඩන යන්ත්‍රයක් 2014 වර්ෂයේ දී සංස්ථාව විසින් රු. 2,656,080 ක් වැය කර අලුත්වැඩියා කටයුතු සිදුකර ඉන් රු. 1,461,440 ක් භාරයෙන් අයකරගෙන තිබුණි. භාරය විසින් ගෙවන ලද මුදල 2015 ජුනි 01 දින සිට දිනකට රු. 10,000 බැගින් ධීවර සංස්ථාවෙන් ආපසු අයකර ගැනීමට භාර මණ්ඩලය 2015 මැයි 26 දින තීරණය කර තිබුණි. එසේ වුවද, 2016 දෙසැම්බර් 28 දින දක්වා මෙම තීරණය ක්‍රියාත්මක කර නොතිබූ අතර, තීරණය ප්‍රකාර වැය කළ මුදල ගිණුම්ගත කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඊ) මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ කැට අයිස් අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් හා ලිඛිත ගිවිසුමකින් තොරව මාසිකව රු. 250,000 ක මුදලක් භාරයට ගෙවිය යුතු බවට නියම කර මාස 3 ක කාලයක් සඳහා මත්ස්‍ය වෙළඳ සංගමය වෙත පැවරීමට 2015 ජුලි 17 දින භාර මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි.

(i) මාස 3 ක කාලය ඉක්මවා අයිස් සැපයීමේ කාර්ය 2016 දෙසැම්බර් දක්වාම පවත්වාගෙන යාමට වෙළඳ සංගමය කටයුතු කර තිබූ අතර, ඒ සඳහා එකඟ වූ මුදලින් කිසිදු මුදලක් භාරයට ගෙවා නොතිබුණි.

(ii) භාර මණ්ඩලය විසින් 2015 ජුලි 17 දින තීරණය කර තිබූ පරිදි කැට අයිස් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ කාර්යය 2016 දෙසැම්බර් 28 දින වන විටත්, ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඪ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට මත්ස්‍ය වෙළඳ සංකීර්ණය සතු තොග වෙළඳකුටි සංඛ්‍යාව 218 ක් හා සිල්ලර වෙළඳ කුටි සංඛ්‍යාව 64 ක් වූ අතර, සියලුම වෙළඳ කුටි සඳහා නීත්‍යානුකූල බදු ගිවිසුමක් භාරය සතුව නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ)	වෙළඳ සංකීර්ණයේ ඉවත දමන අපද්‍රව්‍ය යොදාගෙන සත්ව ආහාර හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර අලෙවි කිරීම සඳහා පෞද්ගලික සමාගමකට පරිශ්‍ර භූමියේ ගොඩනැගිලි ඉදිකර ගැනීමටත් ඒ සඳහා මාසික කුලියක් අයකර ගැනීමටත්, 2014 අගෝස්තු 20 දින ගිවිසුමකට එළඹ තිබුණි. අදාළ සමාගම යන්ත්‍ර සූත්‍ර සකස් කර ගැනීම සඳහා රු. මිලියන 100කට අධික මුදලක් වැයකර ඇති බැවින් මෙකී ගිවිසුම වසර 15ක් තරම් වන දීර්ඝ කාලයකට එළඹීමට කටයුතු කර තිබුණි. වෙළඳ සංකීර්ණයේ අපද්‍රව්‍ය ඉවත් කර ගැනීම වෙනුවෙන් සමාගමට ගාස්තුවක් ගෙවිය යුතු බවට ගිවිසුම අනුව එකඟතාවයක් නොමැති වුවත්, භාරය විසින් මාසිකව රු. 519,000 බැගින් අදාළ සමාගමට ගෙවා තිබීමද මතභේදයට තුඩු දී තිබුණි.

(ආ)	2010 අගෝස්තු 03 දිනැති අංක GM/RP/1288 දරන තක්සේරු වාර්තාව අනුව මාසික කුලිය සිල්ලර වෙළඳ සැල් සඳහා රු.28,000 ක් හා අයිස් යන්ත්‍රාගාරය සඳහා රු.625,000 ක් වුවද එයට පටහැනිව මාසික කුලී පිළිවෙලින් රු. 10,000 ක් හා රු.325,000 ක් වශයෙන් කුලී අයකර තිබුණි.

### 4.4 දෘෂ්‍ය අක්‍රමිකතා

------------------

පිටකොටුවේ පැවති මත්ස්‍ය වෙළඳපල ව්‍යාපාරිකයන් සඳහා ලබාදී තිබූ වෙළඳ කුටිවලට අදාළ බදු ගිවිසුම්වල කොන්දේසි උල්ලංඝනය කරමින් ඔවුන් විසින් වෙනත් පාර්ශවයන්ට වෙළඳ කුටි අලෙවි කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ)	බදු ගිවිසුමේ 14 ඡේදය ප්‍රකාර අදාළ කුටිය හෝ ඉන් කොටසක් හෝ අතුරු බදු දීමට, පැවරීමට, හවුල් ව්‍යාපාරයක් කිරීමට, කොටසක් උකස් කිරීමට, විකිණීමට හෝ කිසිම ගනුදෙනුවක් සඳහා හුවමාරු කිරීමට කිසිදු අයිතියක් බදු ගැණුම්කරු වෙත නොමැති වුවද, එම වගන්තියට පටහැනිව බදු ගැණුම්කරුවන් විසින් තුන්වන පාර්ශවයන්ට 2016 මැයි 31 දින වන විට වෙළඳ කුටි 26 ක් රු. 103,400,000 කට එලෙස අලෙවි කර බදු අයිතිය තෙවන පාර්ශවයන්ට පවරා තිබුණි. වෙළඳ සංකීර්ණයේ වෙළඳ කුටි වෙනත් පාර්ශවයන්ට අලෙවි කර බදු අයිතිය පවරා තිබූ ව්‍යාපාරිකයන්ගෙන් එම වෙළඳ කුටි සඳහා කළමනාකරණ භාරයට අයවිය යුතු රු.1,446,000 ක හිඟ කුලී මුදල් අයකර නොගෙන නව ගැණුම් කරුවන්ට වෙළඳ කුටි පවරා දීමට භාරය කටයුතු කර තිබුණි.

(ආ)	බදු ගිවිසුමේ 20 ඡේදය ප්‍රකාරව යම් හේතුවක් මත බදු ගිවිසුම අවසන් කර නැවත භාරයට භාරදෙනු ලබන හිස් වෙළඳකුටි සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව මිල ගණන් කැඳවා නැවත බදු දීමට කටයුතු කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ තොග වෙළඳ කුටියක වෙළඳපල බදු අගය රු. මිලියන 2.1 සිට රු. මිලියන 4.7 දක්වා පරාසයක පවතින බැව් නිරීක්ෂණය වී ඇති බැවින් හිස් වූ වෙළඳ කුටි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව තරඟකාරී ලංසුකැඳවීම තුළින් බදු දීම මඟින් භාරයට උපයා ගත හැකිව තිබූ විශාල ආදායමක් නොසලකා හැර තිබුණි. මේ අනුව, භාරකරුවන් විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කර භාරයට උපරිම වාසි ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කළමනාකරණ භාරය විසින් 2010 වර්ෂයේ සිට ලංකා ධීවර සංස්ථාවට ලබා දී තිබූ තොග වෙළඳ කුටි දෙකක් 2015 ජුනි 22 දින කළමනාකරණ භාරයට ආපසු භාර දී තිබූ අතර, මෙම වෙළඳ කුටි දෙක ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව නැවත බඳු දීමට කටයුතු නොකර ලංකා ධීවර සංස්ථාවේ සභාපති නම් කළ පුද්ගලයින් දෙදෙනෙකුට පවරා දී තිබුණි.

## 4.5 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ ආපන ශාලාව සඳහා 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.1,143,868 ක් වූ ශීතකරණ 03 ක් මිලදී ගත් දින සිටම ආපන ශාලාව තුළ නිෂ්කාර්යව තිබුණි.

(ආ) වෙළඳසැල් 128 කින් යුතුව ඉදිකර තිබූ සිල්ලර වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල් 64 ක් 2011 හා 2012 වර්ෂ වලදී රු. 9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පත්කර තිබුණද, විගණිත දිනවූ 2016 නොවැම්බර් 30 වනවිට මෙම වෙළඳසැල් 64 හා සිල්ලර වෙළඳසැල් 34 ක් නිෂ්කාර්යව පැවතුණි.

## 4.6 හඳුනා ගන්නා ලද පාඩු

වටිනාකම රු.83,588 ක් වූ වලංගු කාලය අවසන් වූ හැඳුනුම්පත් තොගයක වටිනාකම ලියා හැරීම මූල්‍ය ප්‍රකාශනයන්හි වෙනම හෙළිදරව් කර පෙන්විය යුතු වුවත්, මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය ගිණුමට හර කර තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

භාරය ආරම්භ කර වසර 5ක් ඉක්මවා තිබුණ ද, මත්ස්‍ය වෙළඳ සංකීර්ණය සඳහා අනුමත කර තිබූ 43 කින් යුතු කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර අනුමත කර ගැනීමට අවශ්‍ය පියවර නොගෙන ලංකා ධීවර සංස්ථාවේ හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් මඟින් කාර්ය මණ්ඩල අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කර තිබුණි.

## 4.8 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

භාරය ආරම්භ කර වසර 5ක් ඉක්මවා තිබුණ ද පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය පිහිටි අක්කර 7 රූඩ් 3 පර්චස් 14.9 ක් වූ ඉඩම ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුළත භාරයේ මූල්‍ය වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, භාරය ආරම්භ කළ 2011 වර්ෂයේ සිටම මූල්‍ය වාර්තා ප්‍රමාදව ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරන ලද්දේ මාස 08 කට පසුව එනම්, 2016 නොවැම්බර් 07 දිනදීය.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05 (02) ඡේදයේ උපදෙස් ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

ඉහත චක්‍රලේඛයේ 05(02) (ඉ) ඡේදය ප්‍රකාරව භාරය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබු අතර, අභ්‍යන්තර විගණකවරයෙකු ද පත්කර නොතිබුණි.

**5.4 විගණන හා කළමනාකරණ කමිටු**

විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර එහි රැස්වීම් වාර 3 ක් පවත්වා තිබුණි. විගණන විමසුම් 26 ක් සඳහා පිළිතුරු නොසැපයීම, අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබීම යනාදී පසුබිමක් තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම තුළින් පමණක් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගත නොහැකි වී තිබුණි.

**5.5 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම**

මත්ස්‍ය වෙළඳ සංකීර්ණය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය වෙත අයදුම් කර තිබුණ ද, එම අධිකාරියේ නිර්දේශ අනුව අප ජලය පිරිපහදු කර නිදහස් කිරීමට හා පිරිවිතර වලට අනුකූලව වෙළඳ සංකීර්ණ පරිශ්‍රය පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට 2017 පෙබරවාරි 01 දිනවන විටත් කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලක ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | (i) | බැංකු සැසඳුම් නියමිත පරිදි පිළියෙල කර නොතිබීම හා මුදල් පොතේ සටහන් චෙක් පත් උපපත්‍රිකා සමඟ නොසැසඳීම. |
| | | (ii) | මුදල් පොතේ සටහන් දෙවරක් යෙදීම. |
| | | (iii) | ඉදිරි වර්ෂයට අදාළ සටහන් ඇතුළත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙළෙඳ කුටි බදු දීම, ආදායම් පාලනය හා ගිණුම් ගත කිරීම. | (i) | සියලු වෙළෙඳ කුටි බදු දීමට කටයුතු නොකිරීම. හා වෙළෙඳ කුටි අතුරු බදු දීම |
| | | (ii) | කඩකුලී ආදායම් සඳහා ඉන්වොයිසි නිකුත් කර නොතිබීම. |
| | | (iii) | බැංකු තැන්පතු උපලබ්ධි වීමට පෙර ලදුපත් නිකුත් කර තිබීම හා ලැබීම් කුවිතාන්සි නිකුත් නොකර මුදල් පොතට ගණුදෙනු ඇතුළත් කර තිබීම. |
| | | (iv) | මුදල් පොතට සටහන් ඇතුළත් කිරීමේ දී ජ'නල් සටහන් භාවිත කර තිබීම, අවශ්‍ය අවස්ථාවලදී ජ'නල් සටහන් යෙදීමට කටයුතු කර නොතිබීම හා ජ'නල් සටහන් වලට අදාළ තහවුරු ලේඛන එම සටහන් සමඟ අමුණා නොතිබීම. |